aat
SRI LANKA



# Advanced Financial Accounting

## AA21

## උසස් මූල්‍ය ගිණුම්කරණය

## Advanced Financial Accounting

## (AFA)


SAKYA | ACADEMY OF HIGHER EDUCATION
No. 08, Pieterz Place, Kohuwala, Nugegoda.
Tel: 011 281 4908, 0777 583268
Fax: 011 281 0896
Web: www.sakya.edu.lk

# C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**සහන ට්‍රේඩර්ස්** යනු **සහන්** ට අයත් ඒකලස්වාමි ව්‍යාපාරයකි. 2020 මාර්තු 31 දිනට **සහන ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම පහත පරිදි විය:

**සහන ට්‍රේඩර්ස්**

**2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම | 2,000 | |
| ගොඩනැගිල්ල | 4,750 | |
| මෝටර් වාහන | 2,500 | |
| කාර්යාල උපකරණ | 1,700 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 1,250 |
| මෝටර් වාහන | | 520 |
| කාර්යාල උපකරණ | | 350 |
| විකුණුම් | | 48,000 |
| මිලදී ගැනුම් | 27,170 | |
| 2019 අප්‍රේල් 01 දිනට තොගය | 2,900 | |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 9,000 |
| ස්ථාවර තැන්පතුව (2019 ඔක්තෝම්බර් 01 දින ආයෝජනය කරන ලදි) | 1,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 4,100 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,895 |
| විදුලිය | 1,200 | |
| වැටුප් සහ වේතන | 6,200 | |
| ප්‍රවාහන වියදම් | 500 | |
| ජලය | 190 | |
| බැංකු ගාස්තු | 25 | |
| ප්‍රදර්ශනාගාරයේ කුලිය | 1,100 | |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | | 50 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 5,230 | |
| | **61,065** | **61,065** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනට අවසාන තොගය, පිරිවැයට රු.3,500,000/- කට අගය කරන ලදී.

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂයකට 10% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 25% බැගින් |
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 10% බැගින් |

(3) ස්ථාවර තැන්පතුව සඳහා අදාළ වන පොළී අනුපාතය වර්ෂයකට 8% ක් වන අතර, 2020 මාර්තු මාසය සඳහා ලැබිය යුතු පොලිය **සහන ට්‍රේඩර්ස් හි** ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොතිබුණි.

(4) ගිණුම් පොත්වල වාර්තාකර නොතිබූ 2020 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු බිල් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| විදුලිය | : | රු.75,000/- |
| ජලය | : | රු.21,000/- |

(5) **සහන ට්‍රේඩර්ස්,** 2019 අප්‍රේල් 01 දින, ප්‍රදර්ශනාගාරය සඳහා කුලී ගිවිසුමට එළඹුණු අතර, ප්‍රදර්ශනගාරයේ මාසික කුලිය රු.100,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

**සහන ට්‍රේඩර්ස්**

**2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**විස්තීර්ණ අදායම් ප්‍රකාශය** ( රු. '000)

| | | |
|---|---|---|
| විකුණුම් | | |
| අඩුකලා: ආපසු එවුම් | | |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | | |
| ගැණුම් | | |
| | | |
| අඩුකලා: අවසාන තොගය | | |
| දළ ලාභය | | |
| එකතුකලා: වෙනත් ආදායම් | | |
| | | |
| | | |
| අඩුකලා: බෙදාහැරීමේ වියදම් | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| පරිපාලන වියදම් | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| මුල්‍ය වියදම් හා වෙනත් වියදම් | | |
| | | |
| | | |
| ශුද්ධ ලාභය | | |
| | | |

# සහන ට්‍රේඩර්ස්
## 2020 මාර්තු 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

( රු. '000)

| ජංගම නොවන වත්කම් | පිරිවැය | සමුඃක්ෂය | ශුද්ධ අගය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| ජංගම වත්කම් | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| මුළු වත්කම් | | | |
| හිමිකම හා වගකීම | | | |
| ප්‍රාග්ධනය | | | |
| 2019.04.01 දිනට ශේෂය | | | |
| එකතුකලා: ශුද්ධ ලාභය | | | |
| අඩුකලා: ගැනිලි (මුදල් / භාණ්ඩ) | | | |
| 2020.03.31 දිනට ශේෂය | | | |
| | | | |
| ජංගම නොවන වගකීම් | | | |
| | | | |
| | | | |
| ජංගම වගකීම් | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| මුළු හිමිකම හා වගකීම | | | |
| | | | |

**සහන ට්‍රේඩර්ස්**

**2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**විස්තීර්ණ අදායම් ප්‍රකාශය** **( රු. '000)**

| | | |
|---|---|---|
| **විකුණුම්** | | 48,000 |
| **අඩුකලා: ආපසු එවුම්** | | |
| **<u>අඩුකලා: විකුණුම් පිරිවැය</u>** | | |
| **ආරම්භක තොගය** | 2,900 | |
| **ගැණුම්** | 27,170 | |
| | 30,070 | |
| **අඩුකලා: අවසාන තොගය** | (3,500) | 26,570 |
| **දළ ලාභය** | | 21,430 |
| **එකතුකලා: වෙනත් ආදායම්** | | |
| ස්ථාවර තැන්පතුව පොලී | 60 | 60 |
| | | 21,490 |
| **අඩුකලා: බෙදාහැරීමේ වියදම්** | | |
| මෝටර් රථ ක්ෂය | 625 | |
| ප්‍රවාහන වියදම් | 500 | |
| | | 1125 |
| **පරිපාලන වියදම්** | | |
| ගොඩනැගිලි ක්ෂය | 475 | |
| කාර්යාල උපකරණ ල්ශය් | 170 | |
| ජලය | 211 | |
| විදුලිය | 1,275 | |
| ප්‍රදර්ශනාගාර කුලී | 1,200 | |
| වැටුප් හා වේතන | 6,200 | 9531 |
| **මූල්‍ය වියදම් හා වෙනත් වියදම්** | | |
| බැංකු ගාස්තු | 25 | 25 |
| **ශුද්ධ ලාභය** | | 10,809 |

**සහන ට්‍රේඩර්ස්**
**2020 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** ( රු. '000)

| **ජංගම නොවන වත්කම්** | **පිරිවැය** | **සමුඃක්ෂය** | **ශුද්ධ අගය** |
|---|---|---|---|
| ඉඩම් | 2,000 | | 2,000 |
| ගොඩනැගිලි | 4,750 | 1725 | 3,025 |
| මෝටර් වාහන | 2,500 | 1145 | 1,355 |
| කාර්යාල උපකරණ | 1,700 | 520 | 1,180 |
| | 10,950 | 3390 | 7,560 |
| ස්ථාවර තැන්පතුව | | | 1,500 |
| **ජංගම වත්කම්** | | | |
| අවසන් තොගය | | 3,500 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | | 4,100 | |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතුව පොලි | | 10 | |
| අතැති හා බැංකු මුදල් | | 5,230 | 12,840 |
| **මුළු වත්කම්** | | | 21,900 |
| **හිමිකම හා වගකීම** | | | |
| **ප්‍රාග්ධනය** | | | |
| **2019.04.01 දිනට ශේෂය** | | 9,000 | |
| **එකතුකලා: ශුද්ධ ලාභය** | | 10,809 | |
| **අඩුකලා: ගැනිලි (මුදල් / භාණ්ඩ)** | | | |
| **2020.03.31 දිනට ශේෂය** | | | 19,809 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 1,895 | |
| උපචිත විදුලිය | | 75 | |
| උපචිත ජලය | | 21 | |
| උපචිත ප්‍රදර්ශනාගාර කුලි | | 100 | |
| | | | 2,091 |
| **මුළු හිමිකම හා වගකීම** | | | 21,900 |